ලංකාවට ගිය වාර වලදී මට හමු වූ බොහෝ දෙනෙකුට අවශ්‍ය වුනේ අපේ දුක සැපට වඩා මේ රටට සංක්‍රමනය වෙන්නේ කොහොමද කියන කාරනය ගැන දැනගන්න. ටෙලි නාට්‍යයක් චිත්‍රපටයක් බැලුවත් හැම එකේම තියෙන්නේ ඔස්ට්‍රේලියාවට යන හෝ එන චරිත.

නොයන වැම්බර් මාසය ශ්‍රී ලංකාව බලා යන මොහෝ ශ්‍රී ලාංකිකයනට වැදගත් මාසයක්. එයිනුත් මධ්‍යමේ පාංශික ජීවිත ගත කරන අපි වගේ අයට 20 වෙනිදා කියන්නේ තීරණාත්මක දිනයක්. හේතුව අපි හැමෝම වගේ දන්නවා. එදා සිට ගුවන් ගාස්තු වැඩි වීම. ඉතිං හොට අනිද්‍රා මව රට බලා ගන්න අදහස් කරන් ඉන්න අපටත් ඒ අනුව කටයුතු කරන්න සිදු උනා. මේ දිනවල ටිකක් අව්වෙකියි. ගෙදර යනවා කිව්වම නිකම්ම යන්න පුළුවනිද? ප්‍රශ්න නම් කීයක් තියෙනවද? ඒකත් එක්තරා විදිහක යුද්ධයක් තමා. අවංකවම කියනවා නම් යන එක නම් කොහොම හරි කරගන්නා කියමු. ඒත් එහේ ඉන්න අයගේ, අප වෙනුවෙන් බලා ඉන්න අයගේ අවශ්‍යතා සපුරන එක ලේසි වැඩක් ද? ඒවත් කල යුතු දේවල් නේ.

ඉතිං මය දේශේ කරගන්න විවේකයකුත් තියෙන්න එපායැ. අතික මේ දිනවල අපිට මෙහේ තියෙන සම්ප්‍රදායකට මුහුන දෙන්නකත් වෙලා. මිනිස්සු අමාරුවෙන් හරි තමන්ගේ සංස්කෘතික ගති ලක්ෂණ වලින් කොටසක් හෝ ආරක්ෂා කරගෙන යන එක හොඳ දෙයක්, මම එහෙම කිව්වෙ අපේ මේ ලංකාව බලා යන අයට කැම වේලක් දීමේ පුරුද්ද ගැන. අපි හැමදාම කතා කරන්නේ අපේ නැතිවී යන, නැති කරගෙන තිබෙන දේවල් ගැන නේ. ටික දිනකට හෝ ප්‍රයස් වෙන අයෙකුට කෑම ටිකක් දෙන එක හොඳ දෙයක්. ඒත් එක කල යුත්තේ හොඳ වර්ති වෙතහාරයකින් යන මිනිහට කන්න දීලා ආපසු ආවාම ඒ අයගෙන් කන්න බලාගෙන නම් ඒ වැඩේ කරලා වැඩක් නැහැ.

මම මෙහෙම කිව්වේ මම ලබපු අද්දැකීම් එක්ක. මට අඟිලා දුකලා තිබෙන දේ එක්ක, හුග දෙනෙක් ලංකාව බලා යන අයව එකතු කරලා කෑම දෙනවා, ඊට පස්සෙ අර මිනිස්සු ලංකාවට ගිහින් ආවට පස්සෙ අර කෑම දුන්න මිනිස්සුන්ව එකතු කරලා කුමක් දෙන කෙක් බලා ඉන්නවා. නොදුන්නොත් දොස් කියනවා. මම මේ කියන්නේ හැමෝම ගැන නෙවෙයි. අඩු පාඩු ඉන්නවලට අපි කා ලගත් තියෙනවා. ඒවා හදාගන්නහැකි. ඒත් ඒව හදා ගන්න නම් කවුරුන් හෝ ඒ ගැන කතා කල යුතුයි. ඉතිං අපිත් මේ දවස් වල ඔය කෑම දීමේ පුරුද්ද අද්දැකීමින් ඉන්නවා. මා සමග මගේ හිතවත් මිතුරියක් හා ඇගේ පවුලක් මෙහර ලංකාවට යනවා. ඒනිසා බොහෝ දේවල් කලේ අපි එකට. බඩු තෝරන්න, අඩු මිලට බඩු ගන්න, වගේ දේවල් කරන අතරේ අපි ලබන අද්දැකීම් ගැන කතා කලා. එක අතකට ඒවා හරි හාසය ජනකයි. අනිත් අතට දුකයි. අපි මේ මොහොද කරන්නෙ කියලා. හුකක් ප්‍රශ්න වලට මුල අපිට අවංක වෙන්න බැරි කම නිසා කියලයි මට හිතෙන්නෙ. මම

පොඩි උදාහරණයක් කියන්නම්.

මගේ මිතුරිය පසුගිය දාක ගිහින් තිබෙනා රෙදි වගයක් ගන්න වෙලඳසලකට. එතනදී ඇයට ඕන ගැඹිලා ඇය දන්න තවත් ලංකාවි ලංකාවට යන හිතවතියක්, ඇය ඒ වෙලේ තෝරමින් ඉඳලා තියෙන්න වෙලඳසලේ ඉතාම අඩු මිලට ඇති සාරි රෙදි වගයක් මගේ මිතුරිය දුටු ගමන් ඇය ටිකක් ලැජ්ජාවෙන් වගේ කියලා තියෙන්නේ මම මේ අපේ වත්තේ වැඩ කරන ගැහුන්ට අඳින්න සාරි ටිකක් බලලා කියලා. මගේ මිතුරිය කිසිවක් නොකියා ඇගේ වැඩේ කරගෙන ඇවිත්. ඒත් ඇ දන්නවා ඔවුනට වත්තක් හෝ එහෙම වැඩ කරන කාන්තාවන් නැති බව. ඔක තමයි තත්වය. අපි හැමෝටම ප්‍රශ්න තියෙනවා. ඒත් අපි හැමෝම ආසයි ඉගලින් ඉන්න. පුලු පුලුවන් විදිහට අපේ අයට උදව් කරන්න. ඒත් ඒ දේවල් වල සීමාව නැති කරගෙන තියෙන්නෙත් අපි විසින් මයි. මේ රට ගැන මෙහි අප ජීවත් වන රටාව ගැන අපි අවංකවම අපේ අයට කියනවද? කියන්න කැමතිද? මට නම් හිතෙන්නේ නැහැ කියලා. මාධ්‍ය සහ අප සියලු දෙනා විසින් මෙගේ ජීවිතය ගැන වපුරා තියෙන සාවා තොරතුරු නිසා අපේ ශ්‍රී ලාංකික ඥාතියෝ හිතාගෙන ඉන්නෙ මෙක තවිසාවක් කියලයි. ඉතිං මේ තවිසාවේ ඉඳලා යනකොට අපට වතුර ඉරන් යන්න පුලුවන් ද? ඉරන් යන්න වෙන්නේ අමා පැන්. හෝම් ලෝන්ඩ, ඩේවින්ස්ස් ඉරන් යන්න පුලුවන්ද.. බැහැනෙස්.. ඉරන් යන්න වෙන්නේ දිවා හෝස්ත. සැල්වෙන්න වෙනුවට මාගම යෙර් බලු. ඉතිං ඔක අපි හැම දොනාටම කරන්න පුලුවන් දෙයක්? දරන්න පුලුවන් තත්වයක් ද?

මම කියන්නේ නැහැ අපේ ප්‍රශ්න ඉස්රෙම වෙලේ වල ඉන්න මිනිස්සුන්ට කියන්න ඕනේ කියලා. ඒත් අපි මේ ගන කරන ජීවිත ගැන පොඩි හෝ අවබෝධයක් අපේ ඥාති හිතමිත්‍රාදීන්ට දිය යුතුයි. නැතිව බැලුවට නය වෙලා ලංකාවට ගිහින් යුතු කම් ඉටු කරලා කාලා බීලා ඇවිත් ආරනු පුරුදු යන්තුයටම අපි වැටෙන රටාව වෙනස් කල යුතුයි. ඒක කල යුත්තේ අපිමයි. පසුගිය කාල සීමාව තුළ ලංකාවට ගිය වාර වලදී මට හමු වූ බොහෝ දෙනෙකුට අවශ්‍ය වුනේ අපේ දුක සැපට වඩා මේ රටට සංක්‍රමනය වෙන්න් කොහොමද කියන කාරනය ගැන දැනගන්න. ටෙලි නාට්‍යයක් චිත්‍රපටයක් බැලුවත් හැම එකේම තියෙන්නේ ඔස්ට්‍රේලියාවට යන හෝ එන චරිත. මේ අයට දොස් කියා වැඩක් නැහැ. අපිත් ලංකාවේ ඉන්නකොට හිතුවේ ත් මේ විදිහටමනේ. ගෙයක් දොරක් රැකියාවක් ව්‍යාහයක් නය වෙලා හරි අරන් ඉන්න තියෙනවා නම් ඒක තමයි ජීවිතේ කියල නේ. අද ඒක අපි ලබාගෙන ගත කරන්නෙ මොන වගේ ජීවිතයක්ද කියලත් අපි දන්නවනේ.

ප්‍රධානම කාරනේ මිනිස්සු දන්නේ නැහැ ජීවත් වෙන්න වැඩ කරන්න ඕනේ කියලා මේ රටේදී. ඇත්තටම අපි අපට කරන්න පුලුවන් වදිහට අපේ රටේ මිනිස්සුන්ට මේ තත්වය අවබෝධ කර දිය යුතුයි. මම මේ කියන්නේ මේ රටට මිනිස්සුන්ට එන්න එපා කියන අදහසින් නෙවෙයි. උදව් නොකල යුතුයි කියන අදහසිනුත් නෙවෙයි. ඒ සියලු කාරනා යුතුකම අපෙන් ඉලුවිය යුතු අතරේ මේ සැබෑ තත්වය ගැන අපේ රටේ ඇත්තන් දනුවත් කල යුතුයි කියන අදහසිනුයි. අපිට එහෙම කරන්න පුලුවන් නම් අපි ඉහුන දෙන මොහොඳ ප්‍රශ්න ගැටලු වලට පිලිතුරු හොයා ගන්නත් අපිට පහසු වෙවි.

ලංකාවට යන සියලු දෙනාටම සුබ මගක් ප්‍රාර්ථනා කරන අතරේ අවසාන වශයෙනුත් මම කියන්නේ අපි පරාජය කල යුත්තේ මේ බොරුව හා මායාවට වඩා ඊට ඇති ඉල්ලුම